**පිවිතුරු බලශක්ති හා ප්‍රවේශයන් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2014**

**-----------------------------------------------------------------------**

පිවිතුරු බලශක්ති හා ප්‍රවේශයන් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර එළඹි අංක 2518 සහ අංක 2519 (එස් ආර් අයි) (එස් එෆ්) දරන ව්‍යාපෘති ගිවිසුම්වල හා 2009 ජුනි 17 දිනැති අංක 0149- එස් ආර් අයි දරන ප්‍රදාන ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු,අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**---------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, විදුලි බල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ලංකා විදුලි බල මණ්ඩලය හා සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ (i) වඩා ශක්තිමත් සම්ප්‍රේෂණයක් හා බෙදාහැරීම් ජාලයක් සහ මහනගර සභා වීථි ආලෝකකරණය පිළිබඳ ඉල්ලුම් කළමනාකරණය (ii) කුඩා ජල විදුලිබල පිරියත සඳහා ජාල අවහිරතා ඉවත් කිරීම (iii) නැගෙනහිර පළාතේ වඩා ශක්තිමත් සම්ප්‍රේෂණ ජාලය හා තෝරාගත් පළාත්වල සේවා සම්බන්ධතා සඳහා පුළුල් කරන ලද ණය සහාය වැඩ සටහනක් මඟින් ලංකා විදුලි බල මණ්ඩලයේ හා සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ ආවරණ ප්‍රදේශය හා සේවා කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමෙන් දැරිය හැකි හා විශ්වාසදායී විදුලි බල සැපයුම සාක්ෂාත් කර ගැනීමයි.

ව්‍යාපෘති පරිපාලන ලියවිල්ල ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 20,274.8 කට සමාන එජඩො මිලියන 188.2 ක් වන අතර ඉන් රු.මිලියන 17,689.2 කට සමාන එජඩො මිලියන 164.2 ක් මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 පෙබරවාරි 09 දින ආරම්භ කරන ලද අතර 2013 මැයි 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද ණය අංක 2518 සඳහා 2015 නොවැම්බර් 30 දින දක්වා හා ණය අංක 2519 සඳහා 2015 සැප්තැම්බර් 30 දක්වා ව්‍යාපෘතියේ කටයුතු සම්පූර්ණ කිරීම සඳහා කාල පරිච්ඡේදය දීර්ඝ කර තිබුණි. ආසියානු සංවර්ධන බැංකුව විසින් ප්‍රදානය සඳහා අවසාන දිනය 2015 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය සහ ප්‍රදානවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය සහ ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව,

(ඉ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඊ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(උ) ණය සහ ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඔ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

--------------

**2.1 මතය**

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොදු ලක්ෂණයක් ලෙස ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කරන ලද ස්ථාවර වත්කම් ව්‍යාපෘතියේ දේපල ලෙස විධිමත්ව හඳුනාගෙන ඒ අනුව ගිණුම්කරණ ප්‍රතිකර්ම සිදු කර නොතිබුණි. 2012 වර්ෂයේදී රු.මිලියන 16.13 ක පිරිවැයකට කොන්ත්‍රාත්කරුවන් මඟින් ප්‍රසම්පාදනය කර ලංකා විදුලි බල මණ්ඩලය විසින් භාවිතා කරන ලද මෝටර් වාහන 2 ක් ව්‍යාපෘතියේ දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වනු වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. තවද, 2012 වර්ෂයේදී හා ඊට පසුව කොන්ත්‍රාත්කරුවන් මඟින් ප්‍රසම්පාදනය කර තිබූ පිරිවැය රු.මිලියන 95.56 ක් වූ මෝටර් වාහන 17 ක් එම වත්කම්වල අයිතිය කොන්ත්‍රාත්කරුවන් විසින් ලංකා විදුලිබල මණ්ඩලයට මාරු කර තිබුණද, ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

(ආ) රු.මිලියන 97.17 ක පිරිවැයට ප්‍රසම්පාදනය කර භාවිතා කිරීමකින් තොරව 2014 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ ගබඩාවල පැවතුණු විදුලි උපකරණ හා ද්‍රව්‍ය 2014 දෙසැම්බර් 31 දිනට තොග යටතේ දක්වනු වෙනුවට පරිභෝජනය කළ ද්‍රව්‍ය ලෙස කෙරීගෙන යන වැඩ යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

## 2.2.2 නොසැසඳු ශේෂ

සමාලෝචිත වර්ෂයේ වියපැහැදම් කරන ලද හා 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.මිලියන 2,342 ක්වූ ණය මුදල් හා රු.992,670 ක්වූ ප්‍රදාන, මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලැබූ වාර්තාවල දැක්වෙන රු.මිලියන 2,389 ක්වූ ණය මුදල් හා රු.මිලියන 448 ක්වූ ප්‍රදාන සමඟ එකඟ වී නොතිබුණි. මෙම වෙනස්කම් සැසඳීම සඳහා පියවර ගෙන නොතිබුණි.

## 2.2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

2015 මාර්තු 31 දිනට හෝ ඊට පෙර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 22 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

## 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය/ප්‍රදාන ගිවිසුම්වලට අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන |
| ආ ස බැ | 164.20 | 17,689.20 | 3,750.00 | 17 | 2,343.00 | 101 | 13,071.00 |
| ශ්‍රී ලං ර | 24.00 | 2,585.60 | 46.00 | - | - | - | - |
| ලං.විම | - | - | 426.00 | - | 218.00 | - | 1,451.00 |
| එකතුව | 188.20 | 20,274.80 | 4,222.00 | 17 | 2,561.00 | 101 | 14,522.00 |

## 3.2 භෞතික ප්‍රගතිය

------------------

ලබාගත හැකි වූ තොරතුරු අනුව, සිවිල් වැඩ සඳහා කොන්ත්‍රාත්තු “ටර්න් කී” කොන්ත්‍රාත් ලෙස ප්‍රදානය කර තිබූ අතර 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන් පිළිබඳ භෞතික ප්‍රගතිය පහත දැක්වේ.

| **කාර්යය** | **2014 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය** |
|---|---|
| ---------- | --------------------------------------------- |
| <u>බලශක්ති කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම</u> | |
| (අ) පද්ධති පාලන නවීකරණය | |
| ඒ - පැකේජය | |
| ලොට් 01 - ජාතික පද්ධති පාලන මධ්‍යස්ථානය ඉදිකිරීම | ආරම්භක සැලසුම් වැඩ නිම කර තිබුණි. |
| ලොට් 02 - සන්නිවේදන පද්ධතිය සවි කිරීම | ප්‍රාථමික කාර්යයන් නිම කර තිබුණි. |
| (ආ) <u>සම්ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරීම</u> | |
| ලොට් ඒ 01 - පාලන ගොඩනැගිල්ල ඉදි කිරීම | ඉදිකිරීම් කාර්යයන් ප්‍රගතියේ පවතී |
| ලොට් ඒ 02 - අතිරේක කොන්ත්‍රාත්තු | ප්‍රාථමික හා ඉංජිනේරු කාර්යයන් ආරම්භ කර ඇත. |
| ලොට් ඒ 03 - ට්‍රාන්ස්ෆෝමරය සඳහා අත්තිවාරම ඉදිකිරීම | ඉදිකිරීම් කාර්යයන් ප්‍රගතියේ පවතී. |
| පුත්තලම - මාහෝ සම්ප්‍රේෂණ රැහැන පිළිබඳ වැඩ විෂය පථය වැඩි දියුණු කිරීම | ඉදිකිරීම් කාර්යයන් ප්‍රගතියේ පවතී. |
| (ඇ) <u>බෙදාහැරීම් උප මධ්‍යස්ථාන වර්ධනය කිරීම</u> | |
| කටුනායක, නාවල, කිරිබත්ගොඩ, කොටිකාවත්ත හා හික්කඩුව උප මධ්‍යස්ථානවල ධාරිතාවය වර්ධනය කිරීම | විෂය පථය වෙනස් කිරීම හා ටෙන්ඩර් ලියකියවිලි සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ අනුමැතිය ලබා ගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් වැඩ මෙතෙක් ආරම්භ කර නැත. |
| (ඈ) මහනගර සහා වීථි ආලෝකකරණය සඳහා ඉල්ලුම් කළමනාකරණය | භාණ්ඩ ප්‍රසම්පාදනය කර තිබුණි. |
| (ඉ) උපදේශක සේවා | උපදේශකවරුන් මෙතෙක් තෝරා ගෙන නොතිබුණි. |
| <u>දිළිඳු පුද්ගලයන් සඳහා ප්‍රවේශය</u> | |
| (අ) නැගෙනහිර පළාතේ සම්ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරීම | අවශ්‍ය උපකරණ ආනයනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබුණි. |
| (ආ) ග්‍රාමීය නිවාස සඳහා සම්බන්ධතා | දුෂ්කර ප්‍රදේශවල නිවැසියන් සඳහා ණය 1,334 ක් ප්‍රදානය කර තිබුණි. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

ලංකා විදුලිබල මණ්ඩලය විසින් භාර ගන්නා ලද සියලු විදේශ මූලායයන ව්‍යාපෘති සඳහා වගකීම් දරන ලංකා විදුලිබල මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරීගේ (ව්‍යාපෘති) විෂය පථය යටතට ව්‍යාපෘතියේ කාර්යයන් අයත් නොවේ. එබැවින් ලංකා විදුලිබල මණ්ඩලයට පවරන ලද කොටස් 8 ක කාර්යයන් පිළිබඳ සමස්ත නියාමනය විධිමත්ව සිදුකර නොතිබුණි.